# ප්‍රසම්පාදන දැන්වීමයි

## ආරක්ෂක අමාත්‍යාංශය

# 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා යුධ හමුදාව වෙත වියළි සලාක, අමු සලාක සහ සකස් කළ ආහාර සැපයීම සඳහා සැපයුම්කරුවන් තෝරාපත් කර ගැනීම

### කොන්ත්‍රාත් හඳුනා ගැනීමේ අංකය : S&T/3/Dry Ration/ Fresh Ration/ 2018 (10)

1.0 ශ්‍රී ලංකා යුධ හමුදුව වෙනුවෙන් අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් 2018 වර්ෂය සඳහා පහත වගුවේ සඳහන් පරිදි අදාළ වන ප්‍රවර්ගය සහිතව සේවා ස්ථාන සඳහා අමු වියළි සහ සකස් කරන ලද ආහාර සැපයීම සඳහා පහත සඳහන් කඳවුරු එකකට හෝ වැඩි ප්‍රමාණයක් සඳහා සැපයීමට අපේක්ෂා කරන යෝග්‍යතා පූර්ණ සහ සුදුසුකම්ලත් ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ආයතන, නිෂ්පාදකයින්, සමාගම් සහ සීමිත වගකීම් සහිත සමාගම්, අනෙකුත් වෙළඳ ආයතන වෙතින් මුද්‍ර, තබන ලද ලංසු කැඳවනු ලැබේ. කොන්ත්‍රාත් කාලය 2018 ජනවාරි 01 වෙන දින සිට දෙසැම්බර් 31 වැනි දින දක්වා වේ.

2. සේවා ස්ථාන සමූහ සමග අදළ කාණ්ඩ

| සේවා ස්ථානය | | | ප්‍රවර්ගය |
|---|---|---|---|
| A කාණ්ඩය - හමුදා කඳවුර | | | |
| 2.1.1 අඹේපුස්ස | 2.1.28 කොහොඹගස්හන්දිය | 2.1.56 පාන්ගොල්ල | |
| 2.1.2 අයියාකච්චි | 2.1.29 කොක්එළිය | 2.1.57 පූනානි | |
| 2.1.3 අම්පාර | 2.1.30 කොස්ගම | 2.1.58 පුත්තලම | |
| 2.1.4 බදුල්ල | 2.1.31 කොත්මලේ | 2.1.59 පුදුකුඩුඉරුප්පු | |
| 2.1.5 බටලන්ද | 2.1.32 කෝමාරිය | 2.1.60 රන්ටැඹේ (රන්දෙනිගල) | |
| 2.1.6 බූස්ස | 2.1.33 කුරුණෑගල | 2.1.61 සේනපුර | |
| 2.1.7 බුත්තල | 2.1.34 කුරුවිට | 2.1.62 සිංහපුර (වැලිකන්ද) | |
| 2.1.8 දෙහිඅත්තකණ්ඩිය | 2.1.35 කිරංචි | 2.1.63 සුංගාවිල | |
| 2.1.9 දේවහුව | 2.1.36 කටුබැද්ද | 2.1.64 තන්තිරිමලේ | |
| 2.1.10 දිගන (මාබෙරියතැන්න) | 2.1.37 කුකුලේගඟ | 2.1.65 තාරාවීකුලම් | |
| 2.1.11 දෙඹගොඩ | 2.1.38 ලක්ෂපාන | 2.1.66 ත්‍රිකුණාමලය | |
| 2.1.12 දඹුල්ල (ඉනාමළුව) | 2.1.39 මාදම්පේ | 2.1.67 තුනුක්කායි | |
| 2.1.13 ඇඹිලිපිටිය | 2.1.40 මැදවච්චිය | 2.1.68 උඩවලවේ | සියලුම අමු ආහාර වර්ග (එළවළු, පළතුරු, මාළු, මස්/ ශීත කළ ආහාර, ලෙලි ගසන ලද පොල්, බිත්තර (කිකිළි) කිරි නිෂ්පාදන |
| 2.1.14 ගජසිංහපුර | 2.1.41 මාදුරුඔය | 2.1.69 උකුවෙල | |
| 2.1.15 ගනේමුල්ල | 2.1.42 මාන්කුලම | 2.1.70 ඌව කුඩාඔය | |
| 2.1.16 හොරොව්පතාන | 2.1.43 මත්තේගොඩ | 2.1.71 වව්නියාව | |
| 2.1.17 ඉපලෝගම | 2.1.44 මන්නාරම | 2.1.72 වාකරෙයි | |
| 2.1.18 යාපනය | 2.1.45 මාතර | 2.1.73 වාලච්චේනෙයි | |
| 2.1.19 ජයන්තිගම | 2.1.46 මයුරාපුර | 2.1.74 වරණි | |
| 2.1.20 කලාඔය | 2.1.47 මොරවැව | 2.1.75 වීරවිල | |
| 2.1.21 කල්ලඩි | 2.1.48 මහව (බලල්ල) | 2.1.76 වැලිකන්ද | |
| 2.1.22 කල්ලාර් | 2.1.49 නෙඩුන්කේර්නි | 2.1.77 වෙල්ලන්කුලම් | |
| 2.1.23 කඹුරුපිටිය | 2.1.50 නුවරඑළිය | 2.1.78 වෙල්ලන්කුලම් (වව්නියාව) | |
| 2.1.24 කතරගම | 2.1.51 ඔඩ්ඩුසුඩ්ඩාන් | 2.1.79 වැල්ලවාය | |
| 2.1.25 මහනුවර | 2.1.52 පදවිපරාක්‍රමපුර | 2.1.80 වෙත්තලකේනි | |
| 2.1.26 කටුනායක | 2.1.53 පැලවත්ත | 2.1.81 වේයන්ගොඩ | |
| 2.1.27 කෑගල්ල | 2.1.54 පේදුරුතුඩුව | 2.1.82 විශ්වමඩු | |
| | 2.1.55 පූනරීන් | 2.1.83 යාල පලටුපාන | |

| B කාණ්ඩයේ - ප්‍රවර්ගය - අමු ආහාර වර්ග | ප්‍රවර්ගය - අමු ආහාර | C කාණ්ඩය - ප්‍රධාන ස්ථාන | |
|---|---|---|---|
| 2.2.1 පනාගොඩ | (i) එළවළු | 2.3.1 පනාගොඩ | |
| 2.2.2 අනුරාධපුර | (ii) පළතුරු | 2.3.2 අනුරාධපුර | |
| 2.2.3 හිඟුරක්ගොඩ | (iii) මාළු | 2.3.3 හිඟුරක්ගොඩ | |
| 2.2.4 කන්කසන්තුරේ | (iv) මස් වර්ග / ශීතකල ආහාර | 2.3.4 කන්කසන්තුරේ | වියළි ආහාර අයිතමයන් (අයිතම් 175 ක්) |
| 2.2.5 මුලතිව් | (v) ලෙලිගසන ලද පොල් | 2.3.5 මුලතිව් | |
| 2.2.6 කිළිනොච්චිය | (vi) බිත්තර – කිකිළි | 2.3.6 කිළිනොච්චිය | |
| 2.2.7 දියතලාව | (vii) කිරි නිෂ්පාදන | 2.3.7 දියතලාව | |
| 2.2.8 කොළඹ | (viii) C0 3 තණකොළ | 2.3.8 කොළඹ | |

2.4 එක් එක් ප්‍රවර්ගය සඳහා නිශ්චිත උපදෙස්

2.4.1 A කාණ්ඩයේ එක් එක් කඳවුරු සඳහා සියලුම අමු ආහාර සැපයීම වෙනම ලංසුවක් ලෙස සලකනු ලැබේ. ලංසුකරු විසින් එක් එක් කඳවුර සඳහා සියලුම ප්‍රවර්ගයන් සහ එක් ප්‍රවර්ගයක සියලුම අයිතමයන් සඳහා ලංසු ඉදිරිපත් කළ යුතුවේ. ලංසුකරු විසින් සියලුම ප්‍රවර්ගයන් සඳහා සහ යම් ප්‍රවර්ගයක් සියලුම අයිතමයන් සඳහා ලංසු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ප්‍රතිචාරය නොදක්වූ ලංසුවක් ලෙස සලකනු ලැබේ. 2.1.1 සිට 2.1.83 දක්වා සඳහන් කඳවුර එකක් හෝ වැඩි ප්‍රමාණයක් සඳහා (වෙන් වෙන් වශයෙන්) ලංසු ඉදිරිපත් කළ හැකිය.

2.4.2 B කාණ්ඩයේ යම් සේවා ස්ථානයක එක් ප්‍රවර්ගයක් සඳහා සැපයීම වෙන් වශයෙන් වූ ලංසුවක් ලෙස සලකනු ලැබේ. එක් ප්‍රවර්ගයක සියලුම ආහාර අයිතමයන් සඳහා ලංසුකරු විසින් ලංසු ඉදිරිපත් කළ යුතුයි. එක් ප්‍රවර්ගයක සියලුම ආහාර අයිතමයන් සඳහා ලංසු ඉදිරිපත් කිරීමට ලංසුකරු අපොහොසත් වුවහොත් එම ලංසුව ප්‍රතිචාර නොදක්වූ ලංසුවක් ලෙස සලකනු ලැබේ. 2.2.1 සිට 2.2.8 දක්වා සඳහන් කඳවුරු එකක් හෝ වැඩි ප්‍රමාණයක් සඳහා (වෙන් වෙන් වශයෙන්) ලංසු ඉදිරිපත් කළ හැකිය.

2.4.3. C කාණ්ඩයේ සඳහන් එක් එක් කඳවුරු වෙත එක් එක් වියළි ආහාර වර්ග සැපයීම වෙන් වෙන් වශයෙන් වූ ලංසුවක් ලෙස සලකනු ලැබේ. C කාණ්ඩයේ එක් එක් කඳවුර සඳහා ආහාර අයිතමයක් හෝ අයිතම වැඩි ප්‍රමාණයක් සඳහා ලංසු ඉදිරිපත් කිරීමට ලංසුකරුවන්හට අවසර ඇත. ආහාර අයිතමයන්හි විස්තර ලංසු ලිපිලේඛනයේ සඳහන් කොට ඇත. වැඩිදුර විස්තර සඳහා ලංසුකරු 11.0 ඡේදයේ සඳහන් නිළ දුරකථන අංක සමග සම්බන්ධ විය හැක.

| වගන්තිය | ප්‍රවර්ගය | කොන්දේසි |
|---|---|---|
| 2.5.1 | ඉහත 2.1.1 සිට 2.1.83 දක්වා (A කාණ්ඩය) පරිදි සියලුම අමු ආහාර වර්ග සැපයීම එක් එක් කඳවුර සඳහා සහ ඉහත 2.2.1 සිට 2.2.8 දක්වා (B කාණ්ඩය) පරිදි එක් එක් කඳවුරු සඳහා අමු ආහාර සැපයීම. | වෙන් වෙන් වශයෙන් වූ ප්‍රසම්පාදන ලෙස සලකනු ලබන අතර, වෙන් වෙන් වශයෙන් ලංසු ක්‍රියාවලිය, ඇගයීමේ පරිපාටිය සිදුකරනු ලැබේ. |
| 2.5.2 | ඉහත 2.3.1 සිට 2.3.8 දක්වා (C කාණ්ඩය) පරිදි එක් එක් කඳවුර සඳහා එක් එක් වියළි ආහාර ද්‍රව්‍ය සැපයීම. | වෙන් වෙන් වශයෙන් වූ ප්‍රසම්පාදන ලෙස සලකනු ලබන අතර, වෙන් වෙන් වශයෙන් ලංසු ක්‍රියාවලිය, ඇගයීම් පරිපාටිය සිදු කරනු ලැබේ. |

3.0 මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් 2017.11.09 වෙනි දින 1500 පැය දක්වා රාජකාරී දිනයන් හි 0900 පැය හා 1500 පැය අතර 11.0 වෙනි ඡේදයේ සඳහන් කොට ඇති ලිපිනයේදී ශ්‍රී ලංකා යුධ හමුදපති කාර්යාලයේදී වැඩිදුර තොරතුරු ලබාගැනීම සහ නොමිලේ ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැක.

4.0 ලංසු ලිපිලේඛන නිකුත් කරනු ලබන සහ ලංසු භාර ගැනීම සඳහා වන කාල සටහන පහත දක්වේ.

| ස්ථානය | කාණ්ඩය | ලංසු ලිපිලේඛන නිකුත් කරනු ලබන අවසාන දිනය හා වේලාව | ලංසු භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව සහ ලංසු විවෘත කරනු ලබන දිනය හා වේලාව. |
|---|---|---|---|
| **A කාණ්ඩය** ඉහත 2.1.1 සිට 2.183 දක්වා සඳහන් කරන ලද කඳවුරු | සියලුම අමු සලාක | 2017.11.10 වෙනි දින 1500 පැය දක්වා | ලංසු භාර ගැනීම 2017.11.14 වෙනි දින 0930 පැය දක්වා<br>ලංසු විවෘත කිරීම 2017.11.14 වෙනි දින 10.00 පැයේදී |
| **B කාණ්ඩය** ඉහත 2.2.1 සිට 2.2.8 දක්වා සඳහන් කරන ලද කඳවුරු | අමු ආහාර, වර්ගීකරණය කරන ලද | 2017.11.10 වෙනි දින 1500 පැය දක්වා | ලංසු භාරගැනීම 2017.11.14 වෙනි දින 09.30 පැය දක්වා<br>ලංසු විවෘත කිරීම 2017.11.14 වෙනි දින 1000 පැයේදී. |
| **C කාණ්ඩය** ඉහත 2.3.1 සිට 2.3.8 දක්වා සඳහන් කරන ලද කඳවුරු | වියළි සලාක | 2017.11.10 වෙනි දින 1500 පැය දක්වා | ලංසු භාර ගැනීම<br>2017.11.14 වෙනි දින 9.30 පැය දක්වා<br>ලංසු විවෘත කිරීම.<br>2017.11.14 වෙනි දින 10.00 පැයේදී |

ලංසු, කොළඹ 02, මැලේ වීදියේ කිව් පාරේ අංක 31 හි පිහිටි යුධ හමුද ගුවන් ටිකට් පත් නිකුත් කරනු ලබන කාර්යාල සංකීර්ණයේ පිහිටි කාර්යාලය වෙත ඉදිරිපත් කළයුතු අතර කොළඹ 03, බාලදක්ෂ මාවතේ අංක 15/5 හි පිහිටි ආරක්ෂක අමාත්‍යාංශයේදී ලංසු විවෘත කරනු ලැබේ.

5.0 ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටි මගින් ලංසු මෙහෙයවනු ලබන අතර, විදේශීය ලංසුකරුවන්ට මේ සඳහා ඉදිරිපත් වීමට අවසර නොමැත.

6.0 පහත සඳහන් යෝග්‍යතා නිර්ණායකයන් ලංසුකරුවන් සපුරා තිබිය යුතුයි.

6.1 ලංසුකරු දේශීය වශයෙන් ලියාපදිංචි වූ ශ්‍රී ලාංකික ව්‍යාපාරයක් විය යුතුයි.

6.2 ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතුයි.

6.3 සමාන ස්වභාවයේ ව්‍යාපාරවල නියැලීමේ පළපුරුද්ද ලංසුකරු සතුව තිබිය යුතුයි. ලංසුකරු සම්බන්ධයෙන් යම් දුර්වල කාර්ය සාධනයක් / කාර්ය සාධනය නොමැති කමක් වාර්තා වී එය සනාථ වේ නම් ඇගයීම් පටිපාටියේ දී මුළු ලංසු ප්‍රමාණයම හෝ එක් ලංසුවක් හෝ වැඩි ප්‍රමාණයක් ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇත.

6.4 ලංසුකරු සතුව ප්‍රමාණවත් ශීත කාමර, ගබඩා, ප්‍රවාහන සහ ශීත කරන ලද ට්‍රක් රථ පහසුකම් තිබිය යුතු අතර, එම පහසුකම් සතුටුදයක ලෙස නඩත්තු කර තිබිය යුතුයි.

6.5 ලංසුකරු සතුව ප්‍රමාණවත් මූල්‍ය සම්පත් තිබිය යුතුයි.

6.6 නිශ්චිත කොන්ත්‍රාත්කරු වෙත ප්‍රදානය කරනු ලබන සම්පූර්ණ ප්‍රමාණය/ සම්පූර්ණ වටිනාකම තීරණය කිරීමේදී ඉහත 6.4 සහ 6.5 යටතේ සඳහන් හැකියාවන් පිළිබඳව ස්ථාවර අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව විසින් සලකා බලනු ඇත.

6.7 ලංසු ලිපිලේඛනයේ (ලංසු දත්ත පත්‍රිකාවේ) යෝග්‍යතාවය සහ සුදුසුකම් නිර්ණායකයන් විස්තරාත්මකව සඳහන් කොට ඇත.

7.0 11.0 වන ඡේදයේ සඳහන් කාර්යාලය වෙතින් මිලදී ගනු ලබන ආකෘතිවල ලංසු ඉදිරිපත් කළ යුතුයි.

7.1 මුල් පිටපත හා අනු පිටපතකින් යුත් ලංසු 11.0 ඡේදයේ සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් එවීම හෝ අතින් ගෙනැවිත් භාරදීම සිදුකළ හැකිය. එසේ නැතහොත් 4 වන ඡේදයේ සඳහන් ලංසු භාරගන්නා අවසාන දිනය හා වේලාවට පෙර ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය හැක. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. 11.0 වෙනි ඡේදයේ සඳහන් ලිපිනයේදී එම අවස්ථාවට පුද්ගලිකව පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

8.0 ලංසු, 2018 අප්‍රේල් 30 වෙනි දින දක්වා වලංගු විය යුතුයි.

9.0 ලංසු සමග, 2018 මැයි 28 වෙනි දින දක්වා වලංගු ලංසු ඇපකරයක් අමුණා එවිය යුතුයි. ලංසු ඇපකරය සහ ලංසු ලබාගැනීමේ ප්‍රකාශය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් නමින් ලංසු ලිපිලේඛනයේ (ඇමුණුම් D) ලබාදී ඇති වටිනාකම සඳහා විය යුතු අතර, iv කොටසේ ලබාදී ඇති නිශ්චිත ආකෘතියේ විය යුතුයි.

10.0 ලංසුකරු විසින් අවශ්‍ය විටදී නිෂ්පාදකයන්ගේ බලය පවරා දීමේ සහතික ඉදිරිපත් කළ යුතු වේ.

10.1 ආරක්ෂක අමාත්‍යාංශයේ ආහාර ප්‍රසම්පාදන හා අධීක්ෂණ ඒකකයේ බලධාරින් විසින් ඉල්ලා සිටින විටදී ලංසුකරු විසින් සාම්පල ඉදිරිපත් කළ යුතුයි. ඒ සඳහා නියම කරනු ලබන දිනය හා වේලාවට ප්‍රථම සාම්පල ඉදිරිපත් කරන්නට ලංසුකරු අපොහොසත් වුවහොත් අදළ ලංසුව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10.2 පූර්ව ලංසු රැස්වීමක් 2017.10.30 වෙනි දින 10.00 පැයේදී කොළඹ 03, බාලදක්ෂ මාවතේ අංක 15/5 හි පිහිටි ආරක්ෂක අමාත්‍යාංශයේ 3 වන මහලේ ප්‍රධාන ශ්‍රවණාගාරයේදී පැවැත්වේ.

11.0 ඉහත සඳහන් ලිපිනය නම් :

**ලිපිනය : සැපයුම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ කාර්යාලය,**
**යුධ හමුදා මූලස්ථානය, දකුණු ගොඩනැගිල්ල,**
**ගාලු මුවදොර ටෙරසය, කොළඹ 03.**

**දුරකථන අංක : 0112302569, 011-2302568, ෆැක්ස් : 011-2302569**

**ඊමේල් : dtesandt@army.lk**

**සභාපති,**
**අමාත්‍ය මණ්ඩලය විසින් තෝරාගන්නා ලද**
**ප්‍රසම්පාදන කමිටුව.**

2017.10.21